# බටහිරයන්ගේ උගුරට හොරා බෙත් කෑම

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ප්‍රචණ්ඩත්වය නොමැතිව පැවතිය නො හැකි ය. ඒ ප්‍රචණ්ඩත්වය ඇතිවන්නේ ම පෞද්ගලිකත්වය ඉස්මතුකිරීම හේතුකොටගෙන ය. පුද්ගලයන්ගේ අසීමිත ආශාවන් වර්ධනයකිරීමට, ඉන්ද්‍රිය පිනවීම වැඩිකිරීමට කටයුතුකරන සමාජයක අනෙක් පුද්ගලයන්ට මෙන්ම ස්වභාව ධර්මයට ද එරෙහිව කෙරෙන ප්‍රචණ්ඩත්වය වැඩිවෙයි. අපට අපේ ආශාවන් වර්ධනයකරගත හැක්කේ ඒ වැඩිවන ආශාවන් සංතෘප්තකරගත හැක්කේ එක් අතකින් ස්වභාව ධර්මය සූරාකෑමෙන් ය. එවිට ස්වභාව ධර්මයට එරෙහිව ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මකකිරීමට අපට සිදුවෙයි. බටහිර මිනිසා ස්වභාව ධර්මය විනාශකිරීමට පෙළඹෙන්නේ එබැවින් ය.

බටහිරයන් කෙතරම් අනෙකාගේ නිදහසක් ගැන කීව ද, තම පෞද්ගලික ආශාවන් සංතෘප්ත කරගැනීමේ දී අනෙකාට හිරිහැරකිරීමට සිදුවෙයි. අනෙකාගේ අයිතිය, නිදහස ආදිය ගැන කෙතරම් නීති පැණවුව ද අද බටහිර අපරාධ වැඩිවීම වැළැක්වීමට නොහැකි වී ඇත. විශේෂයෙන් ම කාමුක අපරාධ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවෙයි. මෙවැනි ක්‍රියා නීතියෙන් පමණක් වැළැක්විය නො හැකි ය. අද බටහිර අපරාධකරුවන් අතර වැඩි වැඩියෙන් තරුණයන් සිටිනු දැකිය හැකි ය. මෙයින් කියැවෙන්නේ පුද්ගලයාට එරෙහි ප්‍රචණ්ඩත්වය අද බටහිර රටවල තරුණයන් කරා පැතිරීගොස් ඇති බව ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පදනමේ ම ප්‍රචණ්ඩත්වය ඇතිවිට උඩින් නීති පැනවුව ද සමාජයේ ප්‍රචණ්ඩත්වය පැතිරී යෑම වැළැක්විය නො හැකි ය. අද බටහිර රටවල ප්‍රචණ්ඩත්වය තරුණයන්ට පමණක් නොව ළමයින්ට ද උරුමකර දීමට සිදුවී ඇත්තේ එයට එරෙහිව පණවන නොයෙකුත් නීති මධ්‍යයෙහි ය. තරුණයන්ට හා ළමයින්ට ප්‍රචණ්ඩත්වය පුරුදුකරන්නේ කෙසේ ද? දරුවන්ට හා තරුණයන්ට ප්‍රචණ්ඩත්වය අභිමිකිරීමට එරෙහිව නීති පණවා තිබිය දී ඔවුන්ට ප්‍රචණ්ඩත්වය කියා දෙන්නේ කෙසේ ද? මේ නීති හුදෙක්ම තමන් රවටාගැනීමට වඩා වැඩි දෙයක් නො වෙයි. බටහිරයන් ඒ නීති අස්සෙන් රිංගා ගොස් තරුණයන්ට (හා තරුණියන්ට) ප්‍රචණ්ඩත්වය උරුමකරදෙන්නේ ජනමාධ්‍ය හා කලා කෘති ඔස්සේ ය.

බටහිරයෝ ඊනියා අදහස් ප්‍රකාශකිරීමේ නිදහසක් ගැන කතාකරති. ඔවුහු එලෙසම කලාවේ හා කලාකරුවාගේ නිදහස ගැන කතාකරති. කලාකරුවාගේ ඊනියා ශුද්ධවූ අයිතියක් ලෙස ඒ නිදහස හැඳින්වෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ කැපීම් කෙටීම් තහංචි ආදියෙන් තොරව කලා කෘති ප්‍රදර්ශනයකිරීම ය. කලා කෘතිය සිනමා කෘතියක් නම් හා අධ්‍යක්ෂකවරයා විවිධ හේතු නිසා යැයි කියමින් ප්‍රචණ්ඩත්වය චිත්‍රපටියෙහි නිරූපණයකර ඇත්නම් කලාවේ නිදහස නාමයෙන් එය ප්‍රදර්ශනයකිරීමට අවසර දෙනු ලැබෙයි. අද බ්‍රිතානියේ ඇත්තේ චිත්‍රපටි වාරණ (කපන) මණ්ඩලයක් නොව වර්ගීකරණ මණ්ඩලයක් යැයි මෙරට චිත්‍රපටි අධ්‍යක්ෂවරු ද අභිමානයකින් මෙන් කියති. එහෙත් මේ අභිමානය පිටුපස ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ප්‍රචණ්ඩත්වය ප්‍රචලිතකිරීමට බටහිරයන්ට ඇති අවශ්‍යතාව ය.

සිනමා කෘති වර්ගීකරණයෙන් සිදුවන්නේ සෑම සිනමා කෘතියක් ම ප්‍රදර්ශනය කළයුත්තක් බව කල්තබා ම තීරණයකිරීම ය. කිනම් ආකාරයක ප්‍රචණ්ඩත්වයක්, ලිංගිකත්වයක් තිබිණ ද, සිනමා කෘතිය ප්‍රදර්ශනයකිරීම අනුමත කළයුතු බවත් කළහැක්කේ ඒ කෘතිය කිනම් වර්ගය යටතේ ප්‍රදර්ශනය කළයුතු දැයි තීරණයකිරීම බවත් වර්ගීකරණයෙන් කියැවෙයි. වැඩිහිටියන්ට පමණක් සුදුසු යැයි තීරණයකෙරෙන කෘතියක් වුව ද අවුරුදු දහඅටට වැඩි අයකුට නැරඹිය හැකි ය. අවුරුදු දහඅටට වැඩි අයකුට ඡන්ද බලය ද තිබෙන බව ඇත්ත ය. එහෙත් ජීවිතය පිළිබඳ පරිණත අවබෝධයක් එවැන්නකුට ඇත් ද යන්න ප්‍රශ්නයකි. කෙසේ වෙතත් එවැන්නකු වුව ද ප්‍රචණ්ඩත්වය හා ඉන්ද්‍රිය පිණවීම පිළිබඳ අසීමිත පෞද්ගලික නිදහසක් ඇති බව නිරූපණයකරන චිත්‍රපටි ඊනියා වාස්තවික යථාර්ථය නිරූපණයකරන චිත්‍රපටි ලෙස සලකා නැරඹීමේ ප්‍රතිඵලය කුමක් ද?

එවැනි චිත්‍රපටි හෝ ටෙලිනාට්‍ය හෝ වෙනත් කලා කෘතිවලින් හෝ ඒ නරඹන්නන්ට අව්‍යාජනික ව යම් පණිවුඩයක් ලැබෙයි. ඒ පණිවුඩය නම් ප්‍රචණ්ඩත්වය, ලිංගික අපරාධ ආදිය අනුකරණය නොකළ යුතු දෑ නොවන බව ය. ජාතක කතා කියවන්නකුට එවැනි සිද්ධි සඳහන් කතා කියවීමෙන් ලැබෙන්නේ වෙනත් පණිවුඩයකි. ජාතක කතා ලියා ඇත්තේ

© Prof. Nalin De Silva

ම සිංහල බෞද්ධ සමාජයෙහි ජනයා යහමග යැවීමට ය. සිංහල බෞද්ධ සමාජයෙහි යහමග යන්න බටහිර සමාජයෙහි යහමග යන්න ම නොවන බව නැවතත් අවධාරණය කළයුතු ය. ජාතක කතාවෙහි එවැනි ක්‍රියාවල නිරතවන්නන් අවසානයේ දී  දඬුවම් විඳින බව සඳහන් වන්නේ එවැනි දෑ සමාජයට හා පුද්ගලයාට අහිතකර බව මතක්කරමිනි.

මෙයින් කියැවෙන්නේ ජාතක කතා හා බටහිර කෙටිකතා අතර විශාල පරතරයක් ඇති බව ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා ජාතක කතා හා කෙටි කතා සංසන්දනයකර ඒ අතර මහත් සාම්‍යයක් දැකීමට උත්සාහ කළමුත් අරමුණු වශයෙන් වුව ද එහි වෙනස්කම් ඇත. ඇතැම් බටහිර කලා කෘති නිර්මාණයකිරීමේ දී ප්‍රචණ්ඩත්වය, ලිංගික අපරාධ ආදිය යුක්තියුක්ත කිරීමක් යම් ආකාරයකට හෝ සිදුවෙයි. ජාතක කතාවෙහි එයට හාත්පසින් ම වෙනස්වූවක් සිදුවෙයි. බටහිරයන් අද තම සංස්කෘතියට අවශ්‍ය ප්‍රචණ්ඩත්වය ආදිය ප්‍රචලිතකිරීම සඳහා යොදාගන්නා ප්‍රධාන ම මාධ්‍යය සිනමාව, ටෙලිනාට්‍ය, හා වෙනත් කලා හා සාහිත්‍යයික මාධ්‍ය වෙයි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ප්‍රචණ්ඩත්වයෙන්, ලිංගික අපරාධ ආදියෙන් තොරව පැවැත්මක් නැත. එකිනෙකාගෙන් වෙන් කෙරුණු පුද්ගලයන් තම ඉන්ද්‍රිය පිනවීම පෞද්ගලික අවශ්‍යතාවක් පමණක් නොව අයිතියක් ලෙසත් ඒ වර්ධනයකිරීමත් එවැනි ම අයිතියක් ලෙසත් සලකන සමාජයක අනෙක් අයගේ නිදහස හා අයිතිය පිළිබඳ ඇත්තේ නාමික පිළිගැනීමක් පමණකි. නීතිය ඉදිරියේ ඕනෑම පුද්ගලයකුට ඇති නිදහස අයිතිය ආදිය පිළිගැනී ඇත. පෞද්ගලිකත්වය ඉස්මතු කරන සමාජයක එවැනි පිළිගැනීමක් අවශ්‍ය වෙයි. එහෙත් ඒ අතර ම ඕනෑම පුද්ගලයකුට තමන් රිසිසේ තම ඉන්ද්‍රිය පිනවීම් වර්ධනය කරගැනීමේ අයිතිය ද දිය යුතු ව ඇත.  ඒ සඳහා අවශ්‍ය උත්තේජක ද බටහිර සමාජය විසින් ම සපයනු ලැබෙයි.

ඊනියා පෞද්ගලික නිදහසෙහි ඇති මේ පරස්පරය, එලෙස පරස්පරයක් නොවන අයුරින් පෙන්වමින් ක්‍රියාත්මක කෙරෙන්නේ ඇතැම් කලා කෘති ඔස්සේ ය. කලා කෘතිවලින් අවිඥානික පණිවුඩ සමාජයට ගලා යයි. එසේ ගලායන බව අමතක කරමින් බටහිරයෝ කලා කෘතියකින් පණිවුඩ දීම ගැන විරුද්ධ වෙති. ඒ විරුද්ධත්වය  හේතුවෙන් කලා කෘතියකින් අවිඥානිකව ගලායන පණිවුඩ පිළිබඳ අපට ද අමතක වෙයි. බටහිරයෝ කලා කෘති පණිවුඩ ගලා නොයන, අනෙක් දැයින් වෙන් වූ හුදු කලා කෘති ලෙස අපට හඳුන්වා දෙති.

කලා කෘති එලෙස හඳුන්වාදීමෙන්, එනම් ඒ මතය සමාජයේ තහවුරු කිරීමෙන්, පසු බටහිරයෝ කලා කෘති ඔස්සේ ප්‍රචණ්ඩත්වය, කාම අපරාධ ආදිය ඊනියා තාත්ත්වික නිරූපණ ලෙස කලා කෘතිවලින් සමාජයට දැනගන්නට ඉඩ තබති. එහි ආදීනව ගැන කතා නොකළ යුතු බවට ද ඔවුහු තහංචියක් පණවා ගනිති. ඒ අතර කලාකරුවාට එවැනි දර්ශන තම කලාකෘතිය මගින් කීමට ඇති අයිතියක් ද ලැබෙයි. එහෙත් බටහිරයන් අමතක කරන කරුණ නම් තම කලා කෘතියෙන් ප්‍රචණ්ඩත්වයෙහි හෝ වෙනත් අපරාධයක හෝ ආදීනව කලා කෘතියෙන් නොකිය යුතු යැයි කීමෙන් එසේ කිරීමට අවශ්‍යවන කලාකරුවාගේ නිදහසට තහංචියක් පණවා ඇති බව ය. ඒ තහංචිය ගැන බටහිරයන් හා මෙරට සිටින ඊනියා ප්‍රබුද්ධයන් කියන්නේ කුමක් ද?

අපරාධවලට එරෙහිව නීති පණවා ඇති නමුත් ඒ අපරාධ ඊනියා වාස්තවිකත්වයක් ඔස්සේ යුක්තියුක්ත කරන හා එහි ආදීනව ගැන කතා නොකරන කලා කෘති සමාජයට ඉදිරිපත් කිරීමෙන් බටහිරයෝ ඒ අපරාධ අනුකරණය කිරීම නොහොබිනා ක්‍රියාවක් නොවන බවට අවිඥානික පණිවුඩයක් සමාජයට ලබා දෙති. එසේ අවිඥානික පණිවුඩයක් සමාජයට දීමට කලාකරුවාට අයිතියක් ඇතැයි යන්න ද කලාවේ ඊනියා නිදහසක් මගින් සමාජයෙහි තහවුරු කෙරෙයි. මෙයින් සිදුවන්නේ අපරාධවලට එරෙහිව නීති තිබුණ ද, අපරාධ ප්‍රචාරය කිරීමේ හා අපරාධ යුක්තියුක්ත කිරීමේ අයිතිය සඳහා වූ නීති ද කලාකරුවාගේ අයිතිය, භාෂණ නිදහස ආදී නිදහස් හා අයිතීන් මගින් පණවා ඇති බව ය. මේ උගුරට හොරා බෙත් කැමකි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට තම පැවැත්ම සඳහා ප්‍රචණ්ඩත්වය, ලිංගික අපරාධ ආදිය අවශ්‍ය වෙයි. එහෙත් බටහිරයෝ කවුරුන් හෝ රැවටීමට එවැනි අපරාධකරන්නන්ට දඬුවම්දීම සඳහා නීති ද පණවති.

එක් අතකින් ගත්කල මෙය සාමාන්‍ය බටහිර ප්‍රතිපත්තිය ලෙස ද සැලකිය හැකි ය. බටහිර වෛද්‍යවරු රෝග සුවකිරීමට වඩා වැළැක්වීම යෝග්‍ය යැයි කොපමණ කීව ද අද අප පුරුදු වී සිටින්නේ රෝගී වී ඉන්පසු ප්‍රතිකාර

© Prof. Nalin De Silva

ගැනීමට ය. රෝගී නොවී සිටීමේ පිවන ක්‍රමයක් අපට නැත. බටහිරයන් පැමිණීමට පෙර අපට එවැනි ජීවන ක්‍රමයක් තිබුණ ද, අපි දැන් ඒ අමතක කර ඇත්තෙමු. අද අපේ ආහාරපාන, වත්පැවතුම් හේතුකොටගෙන රෝග ඇතිවීමට පසුබිමක් සැකසී ඇත. බටහිර සමාජය රෝග සුව කිරීමට කටයුතු කරන අතර තවත් පැත්තකින් රෝග ඇතිකිරීම සඳහා කටයුතු කරන්නේ යැයි ද කිව හැකි ය. ප්‍රශ්න ඇතිකර පසුව ඒ විසඳීමට කටයුතු කිරීම බටහිර ලක්‍ෂණයකි.

අපේ පැරණි සමාජයෙහි එනම් ජාතකකතා කියැවුණු හා ලියැවුණු සමාජයෙහි එවැනි ප්‍රතිපත්තියක් නො වී ය. අපරාධවලට එරෙහිව නීති පැණවුණු ඒ සමාජයෙහි අපරාධවල ආදීනව ද කියා දෙනු ලැබිණි. කිසිම දෙයක් අන් කිසිම දෙයකින් මතුපිටින් හෝ වෙන් නොකිරීමට කටයුතු කෙරුණු ඒ සමාජයෙහි හුදු කලා කෘති නො තිබුණි. ජාතකකතා හුදු කලා කෘති නොවුණු අතර, ජාතකකතාවෙන් ජනයා යහමග යැවීම ප්‍රකාශිතව ම අපේක්‍ෂා කෙරිණි. අරමුණු අතින් හෝ අදාළ කෘති නිර්මාණය වූ සමාජ පසුබිම අතින් හෝ ජාතකකතා හා කෙටිකතා එකිනෙක සමග සංසන්දනය කළ නො හැකි ය.

ජාතකකතා හා ඊනියා යථාර්ථවාදී කෙටිකතා වෙනස්වන්නේ  අරමුණ හා සමාජ පසුබිම අතින් පමණක් නො වෙයි. රීතිය අතින් ද ඒ වෙනස් වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා කියා තිබුණ ද, ජාතකතාවල ඊනියා යථාර්ථවාදී රීතියක් දැකිය නො හැකි ය. අද ඇතැම්හු ජාතකකතාවෙහි ඊනියා අධියථාර්ථවාදය ද ඉන්ද්‍රජාල යථාර්ථවාදය ද දකිති. මාර්ටින් වික්‍රමසිංහ මහතා ඒ නො දැක්කේ ද? එසේත් නැත්නම් වර්තමාන වික්‍රමසිංහ කෙනකුට ජාතකතාව අධියථාරථවාදී කෙටිකතාව සමග සංසන්දනය කළ හැකි ද?  මේ ප්‍රශ්නවලට පිළිතුරු ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සංස්කෘතික සංරචකයෙහි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva